ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2018 අප්‍රේල්, 23**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 මාර්තු

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ඩී.ජී.එස්.ජී. මුණසිංහ මහතා 2018 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.8%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 3.2%ක් ලෙස වාර්තා විය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 මාර්තු මාසයේ 8.2% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.9%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.8%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 පෙබරවාරි මාසයේ 123.7ක් වූ දර්ශක අගය 2018 මාර්තු මාසයේ 122.8ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 මාර්තු මාසයේ දර්ශකාංක 0.9ක අඩුවීමක් එනම් 0.7ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.80%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.08%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, ලොකුළූණු, සහල්, රතුළූණු, කෙසෙල්, අළුත් මාළු, අමු මිරිස්, අර්තාපල් සහ පොල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් වියළි හාල්මැස්සන්, ළදරු කිරිපිටි, බිත්තර සහ දෙහි යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 මාර්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘විවිධ භාණ්ඩ හා සේවා’, ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත් ද්‍රව්‍ය’, 'ප්‍රවාහන', ‘රෙදිපිළි හා පාවහන්’ සහ ‘විනෝදාත්මක හා සංස්කෘතික’ යන කාණ්ඩ වලට අයත් සමහර අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම් වල වටිනාකම වැඩිවීම සඳහා 2018, මාර්තු 24 සිට ඉන්ධන සැපයුම්කරුවෙකු විසින් මිල ඉහළ දැමීම හේතු විය. එමෙන්ම 'විනෝදාත්මක හා සංස්කෘතික' කාණ්ඩයේ වියදම් වල වටිනාකම වැඩිවීම සඳහා 2018, මාර්තු මස සිට පුවත්පත්වල මිල වැඩිවීම හේතු විය. පසුගිය මාසය හා සසඳන විට ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයෙන් සමහර අයිතමයන්ගේ ඉතා සුළු මිල වැඩිවීමක් වාර්තාවිය. මෙම මස තුළ 'නිවාස,ජලය, විදුලිය, ‘ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'සන්නිවේදන', ‘අධ්‍යාපන’ සහ 'ආපනශාලා සහ හෝටල් යන කාණ්ඩ වලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවීය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්‍ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |